*සැ. යු.*– මෙවර පලවන ගැසට් පත්‍රයේ V කොටසේ 2000 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජූලි-සැප්තැම්බර් කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,473- 2006 නොවැම්බර් 24 වැනි සිකුරාදා - 2006.11.24

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 986 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 986 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 987 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 දෙසැම්බර් මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 නොවැම්බර් මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 332

ඩීආර්එෆ්ජ්/21/ආර්ර්සීටී/2310.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජනවාරි මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/62211 ලුතිනන් කන්දසාමි සිවඥානම් ශ්‍රීලයුයුබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

11 – 594

ඩීආර්එෆ්ජ්/21/ආර්ර්සීටී/2333.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 01 වන දින සිට අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/649632/ ලුතිනන් සිංගන්කුට්ටි ආරච්චිගේ අමල් ඉන්දික පෙරේරා ශ්‍රිලංසිරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

11 – 622

# ආණ්ඩුවේ නිවේදන

## 1984 අංක 7 පනතින් සංශෝධිත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 42 අ (1) වගන්තිය ප්‍රකාර වූ සහතිකය

ලියාපදිංචි ලිපිනය : සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගම, 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, 1984 අංක 7 දරන පනතින් සංශෝධිත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරි පනතේ 42 (අ) (1) වගන්තිය යටතේ එම අධිකාරිය වෙත පවරා ඇති බලතල මත හා ඒ ප්‍රකාරව ක්‍රියාකරමින් ශ්‍රී ලංකාවේ වලංගු නීති යටතේ ස්ථාපිත සමාගමක් වූ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 315 දරන ස්ථානයේ, සමාගම් ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන්නාවූද, සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගම, "M/V SHA HE KOU" නැවේ නියෝජිතයා වශයෙන් මෙහි මින්මතු සවිස්තරව විස්තර කොට ඇති පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත අයවිය යුතු ගාස්තු, මෙම අධිකාරිය වෙත ගෙවීම පැහැර හැර ඇති බවත්, එකී සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත රුපියල් විසිහය ලක්ෂ හැට හත්දහස් හයසිය හතලිස් හයක (රු.26,67,646) සම්පූර්ණ මුදලක් දැනට අයවිය යුතුව ඇති බවත් මෙයින් සහතික කරමි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගමට සපයන ලද සේවාවන් සම්බන්ධයෙන් අයවිය යුතු ගාස්තු මෙම සහතිකයට "ආ" වශයෙන් අමුණා ඇති උපලේඛනයේ විස්තර කර ඇත.

සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගමෙන් රුපියල් විසිහය ලක්ෂ හත්දහස් හයසිය හතලිස් හයක (රු.26,67,646) සම්පූර්ණ මුදලක් අයවිය යුතු බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහතික කරයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොදු මුද්‍රාව, වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති සාලිය වික්‍රමසූරිය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ ඩබ්. ජී. සමරතුංග ඉදිරියේදී මෙයට තබනු ලබන අතර, එලෙස මුද්‍රා තැබීම ඔවුන් විසින් අත්සන් කර සහතික කරනු ලැබේ.

| | |
|---|---|
| සාලිය වික්‍රමසූරිය, | ඩබ්. ජී. සමරතුංග, |
| සභාපති. | කළමනාකාර අධ්‍යක්ෂ. |

### "ආ" උපලේඛනය

**සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගම විසින් 2002.02.27 වැනි දින "M/V SHA HE KOU" නැව සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් පිළිබඳ වූ ප්‍රකාශය**

2001.02.27 "M/V SHA HE KOU" නැවෙන් (නැව් යොමු අංක 01-6145) RTG 09 ක් සම්බන්ධයෙන් අඩුවෙන් ගෙවන ලද, ටොන් ප්‍රමාණය අනුව ගෙවිය යුතු වරාය ගාස්තුව රු. 26,67,646 (ඇ. ඩො. $30,790) පහත සඳහන් පරිදි වේ.

ඒජන්තගේ නම : සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් ෂිපිං සමාගම,
ඒජන්තගේ ලිපිනය : 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

| *ගෙවිය යුතු මුදල* | - | *ඇ. ඩො. $* |
|---|---|---|
| අයවිය යුතු මුදල | - | 37,156 |
| අඩු කිරීම ගෙවන ලද අත්තිකාරම් | - | (6,366) |
| ගෙවිය යුතුව ඇති මුදල | - | 30,790 |
| විනිමය අනුපාතය | - | 86.64 |
| ගෙවිය යුතු මුදල රුපියල් | - | රු. 26,67,646 |

ඉහත සඳහන් ගෙවිය යුතු මුදල පහත ගෙවීම් ඇතුළත්ව සෑදී ඇත.

| *බිල් අංකය* | *දිනය* | *මුදල* |
|---|---|---|
| 03 DI 875 | 2003.04.25 | රු. 26,62,309.00 |
| 03 DS 420 | 2003.04.26 | රු. 5,337.00 |
| | | රු. 26,67,646.00 |

සකස් කළේ :
පරීක්ෂා කළේ :
සහතික කළේ :

අනුමත කළේ :

11-589

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - නිට්ටඹුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

### රන්කිරි පතිරන්නෙහෙලාගේ ඇන්ටන් ගාමිණී ප්‍රේමචන්ද්‍ර සෙනෙවිරත්න, රන්කිරි පතිරන්නෙහෙලාගේ නිලන්ත සෙනෙවිරත්න සහ ඉමියා පතිරන්නෙහෙලාගේ පද්මසිරි චන්ද්‍රානි පතිරන

වර්ෂ 2006 මැයි මස 25 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක මහත්මිය විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමටලියන ලද්දාවූ ද, 2004 ක්වූ ඔක්තෝබර් මස 08 වැනි දින අංක 4557 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, රන්කිරි පතිරන්නෙහේලාගේ ඇන්ටන් ගාමිණී ප්‍රේමචන්ද්‍ර සෙනෙවිරත්න, රන්කිරි පතිරන්නෙහෙලාගේ නිලන්ත සෙනෙවිරත්න සහ ඉමියා පතිරන්නෙහෙලාගේ පද්මසිරි චන්ද්‍රානි පතිරන ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හැත්තෑ අටදහස් අටසිය අසූතුන (රු. 4,78,883) ක මුදලක් 2005.12.31 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 4,78,883) ක මුදලට 2006.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4557 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රයන් කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභාවේ, පල්ලේවෙල උප කාර්යාල සීමාව තුළ ගල්ගමුවේ පිහිටි "ගලබෝවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. කන්නන්ගර විසින් 1998.11.19 වැනි දින මැන සාදන ලද අංක 1022/1998 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට උතුරට : ආර්. පී. ඒ. ජී. පී. සෙනෙවිරත්නට අයිති ඉඩම සහ පාරෙන්ද, (නමුත් ආර්. පී. ඒ. ජී. පී. සෙනෙවිරත්නට අයිති ඉඩමක් ලෙස ලියාපදිංචි කර ඇත) නැගෙනහිරට : එච්. ඩී. පබිලිස් සිංඤෝට, ටී. කේ. බාබිසිංඤෝ සහ ටී. කේ. ජේම්ස් සිංඤෝට අයිති ඉඩමද, (නමුත් එච්. ඩී. පබිලිස් සිංඤෝ සහ ටී. කේ. ජේම්ස් සිංඤෝට අයත් ඉඩම් ලෙස ලියාපදිංචි කර ඇත.) දකුණට : ටී. කේ. ජේම්ස් සිංඤෝට සහ දයා රාජපක්ෂ යන අයට අයිති ඉඩම් වලින්ද, බටහිරට : වයි. කේ. යාපාට අයිති ඉඩමෙන්ද මායිම් වූ රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම හතයි හතරක් (අ. 0, රූ. 1, පර්. 33.74) විශාලත්වය ඇති ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 749/149 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-657/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මීනුවන්ගොඩ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වීරක්කොඩි ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා

2006.07.27 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමටලියන ලද්දාවූ ද, 2003.10.23 දින හා අංක 632 දරන බැඳුම්කරය සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද්දාවූද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ 2004 ක්වූ ඔක්තෝබර් මස 26 වැනි දින හා අංක 4574 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල ගෙවීම, වීරක්කොඩි ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හාරසිය අනූහතයි ශත හැත්තෑඑක (රු 3,46,497.71) ක මුදලක් 2005.11.30 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,46,497.71 ක මුදලට 2005.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 632 හා 4574 දරනඋකස් බැඳුම්කර මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස්කොට ඇත්තා

වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීගමුව නගර සභා සීමාව තුළ පිටිපන පිහිටි සුදුවැල්ල පාරේ වමේ, වරිපනම් අංක 07 දරන "නෙල්ලිගහවත්ත සහ ජම්බුගහවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩම් කොටසට බලයලත් මානක එච්. එල්. සී. දාබරේ විසින් 1982.03.12 වැනි දින මැන සාදන ලද සහ ඔහු විසින් 2003.01.17 වැනි දින නැවත පිටසන් කරන ලද අංක 3890/1982 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1, 2 සහ 3 දරන (ඒකාබද්ධ) ඉඩම්වලට මායිම් වන උතුරට : ඩී. එම්. ප්‍රනාන්දුට අයිති ඉඩමෙන්ද, වයඹට : ගම් සභා පාරෙන්ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් සහ ගිණිකොණට : ගම් සභා පාරෙන්ද, දකුණට : එල්. ෆාතිමා ප්‍රනාන්දුගේ සහ සිරිල් ප්‍රනාන්දුගේ ඉඩමෙන්ද, බස්නාහිරට : ඩී. ජෝන් ප්‍රනාන්දුට අයිති ඉඩමෙන්ද මායිම් වූ පර්චස් තිහයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 30.3) ක් විශාලත්වය ඇති ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. මෙම ඉඩම මීගමුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 641/138 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-657/2

---

## සීමාසහිත පැන්ඒෂියා බැංකින් කෝපරේෂන් (පී. ඒ. බී.සී. බැංකුව) - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ පී. ඒ. බී. සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

පී. ඒ. බී. සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2006.10.25 වැනි දින පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එල්. සී. ශාන්ත රූකව විසින් ලියා සහතික කරන ලද අංක 9340 හා 2000.12.14 වන දින දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත පැන්ඒෂියා බැංකින් කෝපරේෂන් (කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් ලෙස හඳුන්වන ලැබිය) වෙත අය විය යුතු මුදල් ගෙවීම සෙයාඩ් අහමඩ් මොහොමඩ් නසීර් විසින් පැහැර හැර ඇති බැවින් ද,

වර්ෂ දෙදහස් හයේ අගෝස්තු මස 31 වන දින දක්වා වූ ණය මුදල හා පොලිය වශයෙන් රුපියල් දහතුන් ලක්ෂ තුන්සිය හතලිස් නවයක් හා ශත අසූ අටක (රු.13,00,349.88) මුදලකට හා රුපියල් හත් ලක්ෂ තිස් හත් දහස් පන්සියයක් හා ශත හැට පහක (රු. 737,500.65) ක මුදලකට 2006 සැප්තැම්බර් 1 වන දින සිට වර්ෂයකට සියයට තිස් එකයි දශම පහක (31.5%) පොලියද රුපියල් තුන්ලක්ෂ හැටපන්දහසක මුදල මත (රු.3,65,000) 2006 සැප්තැම්බර් 01 වන දින සිට වර්ෂයකට සියයට විසි අටක (28%) ක පොලිය සමග මෙහි මින් මතු ඇතැම් විට පී. ඒ. බී. සී. බැංකුව නමින් හඳුන්වනු ලබන සීමාසහිත පැන්ඒෂියා බැන්කින් කෝපරේෂන් වෙත දැන් අය විය යුතුව ඇති බැවින් ද,

එකී අංක 9340 දරන බැඳුම්කරය මත අය විය යුතු එකී රුපියල් දහතුන් ලක්ෂ තුන්සිය හතලිස් නවයක් හා ශත අසූ අටක් (රු.13,000,349.88) මුදලක් හා පූර්වෝක්ත පරිදි 2006 සැප්තැම්බර් 01 වැනිදා සිට විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය හා 1990 අංක 04 දරන එකී බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 13 දරන වගන්තිය යටතේ අයවිය යුතු වියදම් හා මුදල් අය කර ගැනීම පිණිස මෙහි උපලේඛනයේ වඩාත් පූර්ණ අන්දමින් විස්තර කර ඇති **PABC** බැංකුවට උකස් කරන ලද දේපළ බලයලත් වෙන්දේසිකරුවන් වන මහනුවර, ටොරින්ටන් පාරේ අංක 24 දරන ස්ථානයේ ෂොක්මන් හා සමරවික්‍රම වෙන්දේසි ආයතනය විසින් 1990 අංක 04 දරන බැංකුව මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර විකිණීමට අනුමැතිය හා බලය ලබාදිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කර ගනු ලැබේ.

උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැ උඩ විල්ලිහත්පත්තුවේ, මහගල්බොඩ මෙගොඩ කෝරළේ හදිරවලාන ග්‍රාමයේ පිහිටි මකුල්කොටුව නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1986.03.15 හා අංක 54A/86 දරන පිඹුරේ අංක 22 හා 23 ලෙස සලකුණු කර ඇති හා උතුරෙන් පිඹුරු අංක 962 හි කැබලි අංක 1 හා ද නැගෙනහිරින් පිඹුරු අංක 54A/86 හි කැබලි අංක 24 ද දකුණෙන් අඩි 12 ක මාර්ගය රක්ෂිතයද, බස්නාහිරින් පිඹුරු අංක 54A/86 හි කැබලි අංක 25 ද (අඩි 15 ක මාර්ග රක්ෂිතය) මායිම් යන තුළ පිහිටි පර්චස් තිස් හතයි දශම පහක් (අ.0, රූ. 0, පර්. 37.5) විශාල යාබද බිම් කොටස් හා එය මත පිහිටි සියලුම දෑ සමග වේ.

මෙය එකී පිඹුරු අංක 54A/86 හි දක්වා මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය සමග වේ.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැ උඩ විල්ලි හත්පත්තුවේ මහගල්බොඩ මොගොඩ කෝරළේ මෙහි ඇල්ල ග්‍රාමයේ පිහිටි බරන්දන හේන, (දැන්වත්ත) නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න විසින් සාදන ලද 1997.03.15 දින අංක 827 දරන පිඹුරේ දක්වා ඇති හා උතුරෙන් යගිලා හෙවත් රනිලා උම්මාගේ ඉඩමෙන් ද; නැගෙනහිරින් එම්. එම්. නසාරිගේ හි එම්. එම්. අන්සාර් ගේ ඉඩම්වලින් ද; දකුණෙන් එකී අංක 827 දරන පිඹුරේ කැබලි අංක 2 න්ද බස්නාහිරින් හිජ්රා මාවතෙන්ද යන මායිම් තුළ වූ පර්චස් විසි අටක් (අ. 0, රූ, 0, පර්. 28) වූ විශාල කැබලි අංක 1 නැමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස, එය මත පිහිටි සියලුම දෑ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වරුණී එගොඩගේ
කළමනාකාරිනී - නීති.

11-675

## සීමාසහිත සෙලාන් බැංකුව - බොරලැස්ගමුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.04 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය - 0340-01500552 -101

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් සහතික කරන ලද 2004.08.06 දිනැති අංක 1264 බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නුගේගොඩ පදිංචි කුරුකුලසූරියගේ චින්තක පෙරේරා සහ ගල්බොක්කේ අරලුවින්නේගෙදර ගුනපාල යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අනූපන්දස් නවසිය හැටනවයයි ශත හැට නවයක (රු. 2,95,969.69) මුදලක් 2006 ජුලි මස 13 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 2,95,969.69 මුදලද 2006 ජුලි 14 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් අත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1264 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකිර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ කුඹුකේ පත්තුවේ ඔලබොඩුව සහ බටුවිට ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. පියසිරි විසින් සාදන ලද 1995 ජුලි 12 දිනැති අංක 2970 දරන සැලැස්මේ සඳහන් දෙබැද්දේහේන, දෙබැද්දේවල, හේනේගෙදරහේන, ඉත්තෑගලහේන සහ ඉත්තෑගලහේන නැමැති ඉඩමෙන් කැබලි අංක 06 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් හිමිකම් කියනු ලබන ඉඩමද, නැගෙනහිරට : කැබලි අංක 7 ද, දකුණ කැබලි අංක 13(පාර, සහ බස්නාහිරට කැබැලි අංක 02 ද යන මායිම් තුළ පර්චස් පහලොවයි දශම බිංදුවයි දෙකක්(අ0, රූ. 0, පර්. 15.2) විශාල ඉඩම.

පහත සඳශන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග

පෙරකී කළුතර පිහිටි එකී අංක 2970 දරන සැලැස්මේ සඳහන් දෙබැද්දේ හේන දෙබැද්දේවෙල හේනේගෙදර හේන ඉත්තෑගලහේන සහ ඉත්තෑගල හේන නැමැති ඉඩමෙන් කැබලි අංක 13 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට කැබැලි අංක 2- 10 ද, නැගෙනහිට කැබැලි අංක 19 සහ 20 ද, දකුණට කැබැලි අංක 11,12, 14,15,16.17,18 සහ 19 සහ ඒ 2 කැබැල්ල, බස්නාහිරට කැබැලි අංක 1 ද, යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් නවයයි දශම බිංදුවයි තුනක් (අ.0, රූ.1 පර් 9.03) විශාල ඉඩම.

පෙරකී කළුතර පිහිටි එකී අංක 2970 දරන සැලැස්මේ සඳහන් දෙබැද්දේහේන දෙබැද්දේවල හේනේගෙදරහේන ඉත්තෑගලහේන සහ ඉත්තෑගලහේන නැමැති ඉඩමෙන් කැබැලි අංක ඒ1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට ඉඩම ප්‍රතිසංස්රණ කොමිසම් සභාවට අයිති ඉඩමද, නැගෙනහිරට : ඔලබොඩුව සිට කුඹුක දක්වා ගම්සහා පාරද, දකුණට : ඒ2 කැබැල්ල සහ බස්නාහිරට : කැබැලි අංක 11, 13, සහ 10 ද යන මායිම් තුළ පර්චස් දෙකයි දශම තුන (අ.0, රූ.0, පර්. 2.3) විශාල ඉඩම.

ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රසිද්ධ කරන අවස්ථාවේදී සීමාසහිත සෙලාන් බැංකුවේ නියොජ්‍ය සාමාන්‍යධිකාරි - නීති , චන්ද්‍රසිරි කොටිගල මහතාට අත්සන් කිරීමට බලය පැවරීමට තවදුරටත් යෝජනා සම්මත කර ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි නීති.

11-553/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - වැලිමඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.08.18 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධි විධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 5752130.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පිරිස් විසින් සහතික කරන ලද 1994 සැප්තැම්බර් 5 දිනැති අංක 8283 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම වැලිමඩ පදිංචි කුතයියා වේලායුදම් සහ සින්නප්පන් සුන්දරාජ් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී කුතයියා වේලායුදම් යන අය ඉන්දුමතී වේලායුදම් වේලායුදම් ත්‍යාගරුදබින්, වේලායුදම් නන්දනී සහ වේලායුදම් කමලාරූබන් යන අය නීත්‍යානුකූල උරුමක්කරුවන් වශයෙන් දේපල වෙනුවෙන් අන්තිම කැමති පත්‍රයක් නොලියා 1996 මාර්තු 27 වන දින මිය ගිය හෙයින්ද ඔවුන් විසින් ඒ අනුව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 7(2) දරන වගන්තිය යටතේ බණ්ඩාරවෙල දිසා අධිකරණයේ අංක බී/ප්‍රොබේට් /10 දරන බුදල් නඩුවෙන් ප්‍රොබේට් බලපත්‍රය ලබා ඇති හෙයින්ද රුපියල් පනස් එක් ලක්ෂ හැටනව දහස් පන්සිය එකයි ශත හතලිස් දෙකක (රු. 51,69,501.42) මුදලක් 1999 පෙබරවාරි මස 28 වන දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව ට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 51,69,501.42 මුදලද 1999

මාර්තු 1 වන දින සිට විකිනීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිහ(30%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් අත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 8283 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ කොට්ඨාශයේ උඩ පලාත කෝරලේ නුගතලාව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී ඩබ්ලිව් වෙල්ගොල්ල විසින් සාදන ලද 1956.05.06 දිනැති අංක 1052 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වැමුල්ල වත්ත සහ උඩුමුල්ල වත්ත හෙවත් උඩුමුල්ලේහේන නැමැති, ඉඩමෙන් කැබලි අංක 1 ලෙස පෙන්නුම් කරන ඉඩම් කොටසට මායිම් උතුරට වැලිමඩ ගෲප් එස්ටේට් ද, නැගෙන හිරට එකී සැලැස්මේ කැබලි අංක 1ඒ සහ කැබලි අිංක 2 ද, දකුණට අගල සහ වේල්ලද, සහ බස්නාහිරට වැවද ය මායිම් තුල අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සක් (අ.1, රූ.3, පර්. 20) විශාල ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ සී 311/166 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙරකී නුගතලාව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 1994.01.03 දිනැති අංක 556 දරන සැලැස්මේ සඳහන් වැමුල්ල වත්ත සහ උඩුමුල්ල වත්ත නැමැති, ඉඩමේ කැබලි අංක 1 ලෙස පෙන්නුම් කරන බෙදා වෙන් කරනලද ඉඩම කොටසට මායිම් උතුරට වැලිමඩ ගෲප් ද, නැගෙනහිරට කැබලි අංක 2 ද, දකුණට ලාහුවැව සහ මෙම ඉඩමේ කොටස සහ කැබලි අංක 2 ද, සහ බස්නාහිරට වැලිමඩ ගෲප් ද යන මායිම් තුල අක්කර එකයි රූඩ් දෙකයි, පර්චස් තිස් එකයි දශම දෙකක් (අ.1, රූ.2, පර්. 31.2) විශාල එකී සැලැස්මේ කැබලි අංක 2 සේ පෙන්වනු ලබන මාර්ග ප්‍රවේශය පාවිච්චි කිරීමේ අයිතිය සමග ඉඩම, මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 515/24 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නීති

11-553/2

---

එන්(පීවීඑස්) 9273

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ වින්ඩ්ස් ඔටෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1992.06.02 දින සංස්ථාපිත සමාගමක් වන වින්ඩ්ස් ඔටෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, වින්ඩ්ස් ඔටෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේදීය.

11-485

---

එන්(පීවීඑස්) 28607

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ යූඑස්පී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2001.06.14 දින සංස්ථාපිත සමාගමක් වන යූ. එස්. පී. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, යූ. එස්. පී. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-489

---

පීවීඑස් 2018.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373 (3) වගන්තිය යටතේ ජයමල් ටුවර්ස් ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන වෙළඳ සමාගම් ආඥාපනත යටතේ 1962.08.13 දින සංස්ථාපිත සමාගමක් වන ජයමල් ටුවර්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත් අද දින සිට තෙමසක් ඉක්මවූ විට, ජයමල් ටුවර්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-488

එන්(පීවීඑස්) 28363.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ රත්න ඉංජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2001.04.30 දින සංස්ථාපිත සමාගමක් වන රත්න ඉංජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට රත්න ඉංජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-487

එන්(ඒ) 513.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ට්‍රින්කොමලි ඩිස්ට්‍රික්ට් ඩිවලොප්මන්ට් ඇසෝෂියේෂන් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1996.01.09 දින සංස්ථාපිත සමාගමක් වන ට්‍රින්කොමලි ඩිස්ට්‍රික්ට් ඩිවලොප්මන්ට් ඇසෝසියේෂන් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියාවිරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ට්‍රින්කොමලි ඩිස්ට්‍රික්ට් ඩිවලොප්මන්ට් ඇසෝෂියේෂන් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2004 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-486

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.